**නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන - අයිඩීඒ - 2015**

---------------------------------------------------------------------------

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2014 සැප්තැම්බර් 12 දින එළඹි අංක 5516 එල්කේ සහ 5517 එල්කේ දරන මූල්‍ය ගිවිසුම්වල 2 උපලේඛනයේ II.ආ.3 වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය

---------------------------------------------------------------------------

වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ල අනුව, එවකට තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය, වර්තමානයේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර සහ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතන 09 වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ල අනුව, 2020 වනවිට දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපලේ ඉල්ලුම සැපිරීමට කාර්යක්ෂම අධ්‍යාපන පද්ධතියක් ගොඩනැගීම හා වෘත්තීය පුහුණුව සඳහා තත්ත්වය, අදාළතාවය, ප්‍රවේශය, පිළිගැනීම මෙන්ම උපකාරක ප්‍රතිපත්ති, පද්ධති හා ආකෘති වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 125,916 කට සමාන එජඩො මිලියන 961.2 ක් වන අතර ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ ආසියානු සංවර්ධන බැංකුව ඉන් රු.මිලියන 13,100 කට සමාන එජඩො මිලියන 100 ක් බැගින් ලබාදීමට අපේක්ෂිතය. තවද, රු.මිලියන 5,423 කට සමාන එජඩො මිලියන 41.40 ක් ජර්මානු රජය සහ කොරියාවේ අපනයන හා ආනයන බැංකුව විසින් ලබාදීමට අපේක්ෂිතය. ඊට අමතරව රු.මිලියන 26,200 කට සමාන එජඩො මිලියන 200 ක් අනෙකුත් ප්‍රභව විසින් මූල්‍යයනය කිරීමට අපේක්ෂිතය. ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය අරමුදල් යටතේ සිදුකල කටයුතු මත අදහස් දැක්වීම් මෙම වාර්තාවේ ඇතුළත් වේ. වැඩසටහන එහි කටයුතු 2014 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2020 වර්ෂය වනවිට නිම කිරීමට නියමිතය.

## 1.3 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------------

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත

විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් වැඩසටහන විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය සහ කාර්මික අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා අර්ධ ස්වායත්ත ආයතන අටෙහි වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ ආයතන 10 යෙහි අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඌ) මූල්‍ය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඈ) මූල්‍ය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩු පාඩු

-----------------------

විශ්ව විද්‍යාල ආයතන 03 ක ඉදිකිරීම් වැඩ වෙනුවෙන් සිදු කළ එකතුව රු.මිලියන 32.93 ක අත්තිකාරම් ගෙවීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

-----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-----------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම්වල මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2015 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | 2015 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසංබැ | 100.00 | 13,100.00 | | 56.65 | 7,670.00 |
| ජාසංසං | 100.00 | 13,100.00 | | 6.51 | 871.36 |
| ශ්‍රීලංර | 519.80 | 68,093.00 | 5,089.00 | | |
| ජර්මානු රජය | 15.40 | 2,017.00 | | | |
| කොරියානු එක්සීම් බැංකුව | 26.00 | 3,406.00 | | | |
| වෙනත් | 200.00 | 26,200.00 | | | |
| | **961.20** | **125,916.00** | **5,089.00** | **63.16** | **8,541.36** |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 5,089 ක් වටිනා අයවැයගත වෙන්කිරීම් සිදුකළද රු.මිලියන 3,103 ක් හෙවත් සියයට 61 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. මිලියන 598.6 ක බැඳීම් නොපියවා තිබුණි.

(ආ) වැඩසටහනේ ශක්‍යතා ලියවිලිවල වියපැහැදම් උපලේඛන අනුව, ජාත්‍යන්තර සංවර්ධන සංගමය වෙතින් රු.මිලියන 4,087.20 කට සමාන එජඩො මිලියන 31.20 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රතිපූර්ණය කර ගත යුතුව තිබුණි. කෙසේ වෙතත් රු. මිලියන 871.36 කට සමාන එජඩො මිලියන 6.51 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

(ඇ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කළ 2015 ජූලි 15 දිනැති ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ලිපියට අනුව, එජඩො මිලියන 6.58 කට සමාන විගැහි (SDR) මිලියන 4.68 ක් මහා භාණ්ඩාගාරය වෙත මාරු කර තිබුණි. කෙසේ වෙතත් මහා භාණ්ඩාගාරයෙන් හා වැඩසටහනේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් ලැබුණු තොරතුරු අනුව, එජඩො මිලියන 6. 51 ක් පමණක් ප්‍රේෂණය කර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

සෑම ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයක් විසින්ම තනිතනිව ක්‍රියාකාරී සැලසුම් සකස් කර තිබුණද ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ දක්වා ඇති ක්‍රියාකාරකම් ආවරණය කිරීමට හා වැඩසටහන් කාලපරිච්ඡේදය තුළ වෙන්කරන ලද රු.මිලියන 125,916 ක සමස්ත ප්‍රතිපාදනය උපයෝජනය කිරීමට වැඩසටහන වෙනුවෙන් විස්තරාත්මක කාර්ය සාධන සැලැස්මක් සකස් කර නොතිබුණි. එසේම වැඩසටහන් කාලපරිච්ඡේදය අවසන් වන විට පොදු අරමුණු ලඟාකර ගැනීමට වැඩසටහනේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන මෙහෙයවීම සඳහා නිවැරදි යාන්ත්‍රණයක් සකස් කර නොතිබුණු බව පිළිබිඹු විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් තවදුරටත් කරනු ලැබේ.

(අ) ප්‍රගති වාර්තාවට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 1,573.16 ක ඇස්තමේන්තුගත පිරිවැයකට ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් 06 ක් අතුරින්, රු.මිලියන 547.33 ක පිරිවැයකට වැඩසටහන් 02 ක් නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය ක්‍රියාත්මක කර තිබුණි. තවද, වැඩසටහන් 24 ක් ක්‍රියාත්මක කිරීමට තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසම වෙත රු.මිලියන 28.51 ක් වෙන්කර තිබුණු අතර වැඩසටහන් 07 ක් පමණක් ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 25.6 ක් වැයකර තිබුණි.

(ආ) රු.මිලියන 174.10 ක වෙන්කිරීමක් සිදු කළ වැඩසටහන් 08 ක් නිමකිරීමට ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය රු.මිලියන 101.87 ක් පමණක් වැය කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 83.41 ක් වෙන්කර තිබුණද, ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ජාතික ආයතනය වැඩසටහන් 03 ක් ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 30.15 ක් වැයකර තිබුණි. එබැවින් අදාළ කටයුතු වෙනුවෙන් සත්‍ය අරමුදල් අවශ්‍යතාවය පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක් කිරීමකින් තොරව ඉහත දක්වන ලද ආයතන යටතේ වැඩසටහන් සඳහා වෙන්කිරීම් සිදුකර තිබුණු බව පිළිබිඹු විය.

(ඇ) ජාත්‍යන්තර සංවර්ධන සංගමය සමඟ එළඹී මූල්‍ය ගිවිසුමේ ව්‍යාපෘති සම්බන්ධ දර්ශක -03 අනුව, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවල මූලිකත්වය ලබාදිය යුතු ක්ෂේත්‍ර සඳහා අධ්‍යයන කාර්යමණ්ඩලය වෙනුවෙන් සේවක සංඛ්‍යාව නිර්ණය කිරීමට මානව සම්පත් ප්‍රතිපත්තියක් සහ ඒ සම්බන්ධ බඳවා ගැනීම් පරිපාටිය පිළියෙල නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය කටයුතු කළ යුතුය. කෙසේ වෙතත් තාක්ෂණික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසම, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව, ලංකා-ජර්මන් තාක්ෂණික පුහුණු ආයතනය සහ ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය වෙනුවෙන් නව බඳවා ගැනීමේ ප්‍රතිපත්ති 2015 දෙසැම්බර් 31 දින වන විටත් සකස් කර නොතිබුණි. තවද, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවල කථිකාචාර්ය හා උපදේශක තනතුරු 4,039 ක අනුමත කාර්ය මණ්ඩලය අතුරින් 2015 දෙසැම්බර් 31 දිනට තනතුරු 1,337 ක් පුරප්පාඩුව පැවතුණි.

(ඈ) වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ල අනුව, ශ්‍රී ලංකාවේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය මෙන්ම පුහුණුවල ගුණාත්මකභාවය හා තත්ත්වය වැඩිදියුණු කිරීම, වැඩසටහනේ අවසන් ප්‍රතිඵලය විය යුතුය. එමනිසා වෘත්තීය ආයතන විසින් දැනට පවත්වාගෙන යනු ලබන අධ්‍යයන පාඨමාලා, රටේ පවතින තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය මෙන්ම පුහුණුව සඳහා ජාත්‍යන්තර තත්ත්වය තහවුරු වන පරිදි ජාතික වෘත්තීය සුදුසුකම් (එන්වීකියු) මට්ටම දක්වා අධ්‍යයන පාඨමාලා වැඩි දියුණු කිරීමට කටයුතු කළ යුතුය. ඉදිරිපත් කළ තොරතුරු අනුව, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන 08 ක් විසින් වර්තමානයේදී පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා 3,732 කින්, 2015 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන පාඨමාලා 2,532 ක් පමණක් ප්‍රතීතනය කර තිබුණි.

(ඉ) වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ල අනුව, තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන අංශයේ සේවා නියුක්ත මට්ටම වැඩි කිරීමට පුද්ගලික - රාජ්‍ය හවුල්කාරීත්වය තුළින් විශ්ව විද්‍යාල ආයතන 05 ක් ස්ථාපිත කිරීමට නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය කටයුතු කිරීමට අවශ්‍ය විය. කෙසේ වෙතත් පුද්ගලික - රාජ්‍ය හවුල්කාරීත්ව ආකාරයෙන් විශ්ව විද්‍යාල ආයතන 03 ක් පමණක් 2015 දෙසැම්බර් 31 දිනට ස්ථාපිත කර තිබුණි.

(ඊ) වැඩසටහන් ශක්‍යතා ලියවිලි අනුව, වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය යටතේ 2015 දෙසැම්බර් 31 දිනට වෙනත් විශ්ව විද්‍යාල විද්‍යායතන 14 ස්ථාපිත කිරීම මෙන්ම තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීම වැඩිකිරීමට කටයුතු කළ යුතුය. විශ්ව විද්‍යාල විද්‍යායතන 06 ක ඉදිකිරීම් වැඩ නිම කළද 2015 දෙසැම්බර් 31 දිනට එවැනි විශ්ව විද්‍යාල විද්‍යායතන 05 ක අධ්‍යයන කටයුතු ආරම්භ කර තිබුණු බව නිරීක්ෂණය විය. එවැනි විශ්ව විද්‍යාල විද්‍යායතනවල මෙහෙයුම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බටන්ගල විශ්ව විද්‍යාල විද්‍යායතනයේ අධ්‍යයන කටයුතු 2015 දෙසැම්බර් 31 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි. තවද, විශ්ව විද්‍යාල ආයතනවල අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් විවිධ ශ්‍රේණිවල සේවකයින් සාමාජිකයින් 18 දෙනෙකු 2015 දෙසැම්බර් 31 දිනට විශ්ව විද්‍යාල විද්‍යායතනවල වසරකට වැඩි කාලයක් නිෂ්කාර්යව ඇත. සමාලෝචිත වර්ෂය තුළදී ඔවුන් වෙත රු.මිලියන 4.99 ක පාරිශ්‍රමිකද ගෙවා තිබුණි.

(ii) ඉහත දක්වන ලද විශ්ව විද්‍යාල විද්‍යායතන 05 හි අධ්‍යයන පාඨමාලා 51 සඳහා ශිෂ්‍යයින් 1,260 ක් ඇතුළත් කර ගැනීමට පහසුකම් සමන්විතව ඇතත් අධ්‍යයන පාඨමාලා 42 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී සිසුන් 487 ක් පමණක් ඇතුළත් කර ගැනීමට හැකිවී තිබූ අතර ඉන් සිසුන් 146 ක් සමාලෝචිත වර්ෂය තුළදී එම පාඨමාලාවන් අතහැර දමා තිබුණි.

(iii) තවද, විශ්ව විද්‍යාල ආයතන 05 ක කථිකාචාර්ය තනතුරු 40 ක්, උප ප්‍රධානාචාර්ය තනතුරු 15 ක්, රසායනාගාර තනතුරු 11 ක් 2015 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.4.1 ඡේදය ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු පරිපාටි අනුගමනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 5.51 ක අගයකට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාල ආයතනයට නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන් ඒකකය වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ උපකරණ ප්‍රසම්පාදනය කර තිබුණි. තවද, කොන්ත්‍රාත්තුව 2014 දෙසැම්බර් 23 දින පිරිනමා තිබුණද කොන්ත්‍රාත්තුව පිරිනැමූ දින සිට මාස 10 කින් පසුව 2015 ඔක්තෝබර් 21 දින කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් තබා තිබුණි. ඊට අමතරව ගුණත්වය තහවුරු කිරීමේ කටයුතු සඳහා පරික්ෂා කිරීමකින් හා බලය ලබා ගැනීමකින් තොරව එම උපකරණ ප්‍රයෝගික පුහුණු කටයුතු සඳහා භාවිතා කර තිබුණි.

**3.4 නිෂ්කාර්ය/ඌන උපයෝජිත වත්කම්**

**--------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 210.32 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කළ පුහුණු උපකරණ, අදාළ පුහුණු පාඨමාලා නියමිත කාලයේදී පවත්වා නොතිබීම නිසා වෘත්තීය තාක්ෂණික විශ්ව විද්‍යාලය යටතේ ක්‍රියාත්මක වන කටුබැද්ද, රත්මලාන, බටන්ගල සහ කුලියාපිටිය විශ්ව විද්‍යාල විද්‍යායතනවල වසරකට වඩා වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණු බව නිරීක්ෂණය විය.

(ආ) තවද, රු.මිලියන 424.33 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කළ අනෙකුත් පුහුණු උපකරණ රසායානාගාර, ජලය, විදුලිය ආදි අනෙකුත් පහසුකම් නොමැතිවීම හේතුවෙන් වෘත්තීය තාක්ෂණික විශ්ව විද්‍යාලය යටතේ ක්‍රියාත්මක වන මාතර, රත්මලාන සහ කුලියාපිටිය විශ්ව විද්‍යාල ආයතනවල වසරකට වඩා වැඩි කාලයක් ඌන උපයෝජිතව පැවතුණි.

### 3.5 මූල්‍ය පාලනයේ ගැටලු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ලේ 24 වන ඡේදයට අනුව, නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ ආයතනවල අභ්‍යන්තර විගණන ඒකක ඉහල බලපෑමක් ඇති අවදානම් පාදක විගණන කටයුතු සිදුකළ යුතු අතර වැඩසටහනේ අතිරේක ලේකම් ක්‍රියාත්මක කිරීමේ අරමුණු සඳහා අදාළ කටයුතු නියාමනය කිරීමට අපේක්ෂිතය. රේඛීය අමාත්‍යාංශය හා අනෙකුත් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවල අභ්‍යන්තර විගණන ඒකක ස්ථාපිත කර විගණකයින් 56 ක් සේවයේ යොදවා තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් වැඩසටහන විසින් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන 05 ක සිදුකළ ක්‍රියාකාරකම් අභ්‍යන්තර විගණනයට යටත් කර නොතිබුණි. තවද, අනෙකුත් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයන්ගේ අභ්‍යන්තර විගණන ඒකකවල විස්තරාත්මක ක්‍රියාකාරී ක්‍රියාකාරකම් සැලසුම් අනුව, වියපැහැදම් ගෙවීම් සම්බන්ධ දර්ශක මත පදනම් වූ ඉහල බලපෑමක් ඇති අවදානම් පාදක විගණනයන් සැලසුම් කිරීමට හා සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ 2014 මැයි 19 දිනැති අංක 4-1/2/1/17 දරන ලිපියට අනුව, වැඩසටහනේ පුහුණු හා අනෙකුත් කාර්යමණ්ඩලය සඳහා දිරිදීමේ යෝජනා ක්‍රමයක් හඳුන්වා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඒ වෙනුවෙන් රු.මිලියන 138.13 ක් වියදම් කර තිබුණි. කෙසේ වෙතත් වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි දිරිදීමනා වැඩසටහන් ඇගයීම් සිදු කිරීමට නිර්නායක හා යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන හඳුන්වා දී නොතිබුණි.

### 3.6 පරිබාහිර කාර්යයන්

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසම විසින් සමාලෝචිත වර්ෂය තුළදී ණය අරමුදලින් වැය කළ රු.මිලියන 2.56 ක්, වැඩසටහනේ අරමුණු ලබා කර ගැනීමට සෘජු සම්බන්ධතාවයක් නොවීය.

### 3.7 පෙර විගණන වාර්තා මගින් පෙන්වා දුන් නොවිසඳුණු විගණන නිරීක්ෂණ

පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමකින් හා එකම කාණ්ඩයේ අයිතම වර්ග කිරීමකින් තොරව නිෂ්පාදන තාක්ෂණ පාඨමාලා සඳහා රු. මිලියන 186 ක පිරිවැයකට පුහුණු කිරීමේ ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීමට 2014 වර්ෂයේදී ලංසු කැඳවා තිබුණු බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස ලංසුකරුවන් මිල ගණන් කැඳවන ලද අයිතම 97 ක් අතුරින් අයිතම 35 ක් සඳහා ලංසු ඉදිරිපත් කර නොතිබුණි. ඉදිරිපත් නොකළ අයිතම සඳහා මිල ගණන් යළි කැඳවීමට තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව නියෝග කර තිබුණද, නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ නිපුණතා ආංශික සංවර්ධන ඒකකය 2016 මැයි 31 දින වන විටත් මිල ගණන් යළි කැඳවීමට කටයුතු කර නොතිබුණි.